| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda | |
|---|---|---|
| | වාරය - II | |
| **ශ්‍රේණිය : 10** | **විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පාඩම : 8 - මේ අපේ උදාර වූ මාතෘ භූමියයි** |

**පාඩමේ අන්තර්ගතය කෙටියෙන් :**

- තමන් උපන් ජන්ම භූමිය පිළිබඳව සැම කෙනෙකුටම ඇත්තේ අභිමානයකි.
- දේශානුරාගය යනු තම මව්බිම පිළිබඳ ඇති ඇල්මයි.
- දේශාභිමානය යනු තම මව්බිම පිළිබඳ ඇතිවන අභිමානවත් බව මෙන් ම ආඩම්බරයයි.
- දේශප්‍රේමීත්වය යනු තම මව්බිම පිළිබඳ සිතේ ඇතිවන ආදරය යි.
- ජන්ම භූමියේ අභිමානය පිළිබඳ සාහිත්‍ය නිර්මාණකරුවන් ඔවුන්ගේ සිත් තුළ ජනිත වූ නිර්මාණ රැසක් ඉදිරිපත් කර ඇත.
- ඒ අතර මහගමසේකර , එස්.මහින්ද හිමි,මඩවල එස්.රත්නායක , ශ්‍රී රාජසේකර ,මනෝ ප්‍රනාන්දු , ඩබ්ලිව්.ඒ.අබේසිංහ යන දෙස් විදෙස් නිර්මාණ කරුවන් ප්‍රමුඛ වේ.
- මහගමසේකර සූරීන්ගේ ‘රත්න දීප ජන්ම භූමි‘ නම් කාව්‍යයට දේශාභිමානී නිර්මාණ අතර ප්‍රමුඛ තැනක් හිමි වේ.
- මැණික්වලින් පිරුණා වූ විජයග්‍රාහී වූ මේ අපේ උදාර වූ මාතෘ භූමිය සාරවත් වී ඇත්තේ අතීත මී මුත්තන්ගේ උදාර වූ ලේවලින් බව නිර්මාණයේ අපූරුවට දක්වා ඇත.
- විදේශිකයෙකු වුව ද ස්වදේශිකයෙකුට ද වඩා සිරිලක් බිම පිළිබඳව ඇල්මක් අභිමානයක් පැවති ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියෝ මව්බිම පිළිබඳ අගනා නිර්මාණ රැසක් අපට දායාද කර ඇත.
- නිදහසේ මන්ත්‍රය , නිදහසේ දැහැන,ජාතික තොටිල්ල ,අපේ ඉදිරි ගමන, අද ලක්මවගේ පුත්තු ,විදේශිකයෙකුගෙන් ලක්මවට නමස්කාරයක්,ලංකාව ඉදිරියට, ශ්‍රී ලංකා උදය ගීත ආදී පද්‍ය නිර්මාණ ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ නිර්මාණ අතර වේ.
- ‘පෙර රජ දවස ලංකාව ’ පද්‍ය රචනයෙහි සිරිලක් ජනයා කරුණාව , මෛත්‍රිය , මුදිතාව ආදී සදහම් රකින පිරිසක් බවත් , මේ පින්බිම එකම දහම් දිවයිනක් බවත් එස්. මහින්ද හිමියෝ පවසති.
- රසවත් වචන කතා කරන මිනිසුන් ඇති, වටිනා මුතු,මැණික්වලින් පිරුණු සාගරයක් හිමි උතුම් රටක් ලෙස ශ්‍රී ලංකාව විදේශිකයින් පවා දැක ඇති බව නවවන සියවසේ භාරතයේ විසූ ප්‍රකට පඬිවරයෙකු වූ ශ්‍රී රාජසේකරයන් ලියූ ‘බාල රාමායණය’ කෘතියෙන් ප්‍රකට වේ.

- පර්සියානු ජාතික ‘විලියම් නයිමෝත් ’ විසින් 1854 දී රචනා කළ ‘Forest Life In Ceylon‘ කෘතිය මනෝ ප්‍රනාන්දු විසින් ‘ලක්බිම වන සැරිය‘ නමින් සිංහල බසට පරිවර්තනය කෙරිණි.එහි සඳහන්ව ඇත්තේ ද අප පුණ්‍ය භූමියේ වනාන්තර, මුහුදුබඩ පරිසරය, වාතය හා ජනයා පිළිබඳ ඔහු තුළ පැවති ආකර්ෂණශීලී බවයි.

- “ලංකාවේ ඉතිහාස කතන්දරය“ නමින් විදේශීය ජාතික රොබට් නොක්ස් ලියූ කෘතිය ඩේවිඩ් කරුණාරත්න විසින් “එදා හෙළදිව“ නමින් සිංහලයට නගන ලදී.එම නිර්මාණයේ ශ්‍රී ලාංකිකයන්ගේ සාමාජීය , ආර්ථික, සංස්කෘතික ,දේශපාලනික තොරතුරු පිළිබඳ ලියා ඇත.
- තම මාතෘ භූමිය පිළිබඳ අනුරාගයක්,අභිමානයක් ඇති කර ගැනීම පමණක් ප්‍රමාණවත් නොවන බවත්, අප යායුතු මඟ ද හඳුනාගත යුතු බවත් මඩවල එස් රත්නායකයන්ගේ ‘වෙර වීරිය ඇතත් හිතේ............‘ යන නිර්මාණයෙන් පැහැදිලි කරයි.

- මෙම නිර්මාණ තුළින් කියවෙන්නේ අභිමානයෙන් යුතු ව මව්බිම අනගත පරපුරට රැකදීම අපේ පරම යුතුකමක් බවයි.

පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. දේශානුරාගය පිළිබඳව නිර්මාණ ඉදිරිපත් කළ ලාංකික නිර්මාණකරුවන් තිදෙනෙකු නම් කරන්න.
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

02. විදේශීය නිර්මාණකරුවන් ද අප දේශයේ අභිමානය පිළිබඳ නොයෙකුත් නිර්මාණ ඉදිරිපත් කර ඇත. එවැනි නිර්මාණ දෙකක් සහ කතුවරු දෙදෙනෙකු නම් කරන්න.
........................................................................................................................
........................................................................................................................

03. 'බාල රාමායණය', 'අද ලක්මවගේ පුත්තු' යන නිර්මාණවල කතුවරු නම් කරන්න.
........................................................................................................................
........................................................................................................................

04. 'රාන්නයේ ෂුරවිලි, කෙටි නව කතාවේ කතුවරයා කවුද? පසුව එය සිංහලයට පරිවර්තනය කළ කතුවරයා කවුද?
........................................................................................................................

05. එම කෘතිය ආරම්භ වන්නේ කෙසේද?
........................................................................................................................

06. එම කෘතියේ සඳහන් චරිතයක් නම් කරන්න.
........................................................................................................................

07. 'කුඹුරෙන් ගෙන මඩ සෝදා ගත් සිංහලයා සිංහාසනය හෙබවීමට සුදුස්සේය'. යන කොටස ඇතුළත් කෘතිය කුමක්ද?
........................................................................................................................

08. ලෝකයේ මුල් ම හා උතුම් ම රැකියාව ලෙස හඳුන්වා ඇත්තේ කුමක්ද?
........................................................................................................................

09. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
........................................................................................................................
........................................................................................................................

10. දස රාජ ධර්මය නම් කරන්න.
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

11. 'අභිමානවත් බවෙන් පිරි සුන්දර ශ්‍රී ලංකාව' මැයෙන් වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.